

කාර්යසාධන වාර්තාව
2024

කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

පටුන

	පරිච්ඡේදය	පිටු අංකය
01: ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය		
1.1	හැඳින්වීම	1 - 1
1.2	දැක්ම හා මෙහෙවර	2 - 2
1.3	පරමාර්ථ, ප්‍රධාන ක්‍රියාවන් හා ප්‍රධාන කාර්යයන්	2 - 3
1.4	සංවිධාන සටහන	4 - 4
02: ප්‍රගතිය හා ඉදිරි දැක්ම		
2.1	රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම	5 - 8
2.2	රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම	8 - 10
2.3	ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම	10 - 10
2.4	අභියෝග සහ අනාගත අරමුණු	11 - 11
03: 2024 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය		
3.1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	12 - 12
3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	13 - 13
3.3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	14 - 14
3.4	මූල්‍ය ප්‍රකාශ සටහන්	15 – 15
3.5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	15 - 15
3.6	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	15 - 15
3.7	මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	15 - 15
3.8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	16 - 16
3.9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	16 - 16
04: කාර්ය සාධන දර්ශක		
4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	17 - 17

	පරිච්ඡේදය	පිටු අංකය
05: තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය		
5.1	හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු	18 - 19
5.2	තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග	19 - 19
06: මානව සම්පත් පැතිකඩ		
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	20 - 20
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය	20 - 20
6.3	මානව සම්පත් සංවර්ධනය	20 - 21
07: අනුකූලතා වාර්තාව		22 - 28

වගු

2.1	රජයට අයත් සමස්ත වාහන සංඛ්‍යාවෙහි වයස් විශ්ලේෂණය	6 - 6
2.2	කුළියට ලබාදී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය	7 - 7
2.3	රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ සාරාංශය	8 - 8
2.4	මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම	10 - 10

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යය සාධන වාර්තාව
කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
වැය ශීර්ෂ අංකය 333

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

2017 අයවැය යෝජනාව අනුව, රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය 2017 මාර්තු 07 වන දින පිහිටුවන ලදි. ඒ අනුව, රාජ්‍ය ආයතන (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) යටතේ පවතින මූල්‍ය නොවන වත්කම් පිළිබඳව යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම සහ නිසි පරිදි ප්‍රයෝජනයට නොගන්නා සම්පත් හඳුනාගනිමින් හා මෙම වත්කම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරමින්, රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. රජයේ වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීම, වත්කම් නිසි ලෙස ආරක්ෂා කිරීම සහ වත්කම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම වෙනුවෙන් කාර්යක්ෂම ක්‍රමවේදයකට අනුගත වීම සඳහා කටයුතු කිරීමට වෙන් වූ ආයතනයක් නොමැතිවීම හේතුවෙන් රජයේ මූල්‍ය නොවන වත්කම් ඵලදායීව යොදවා ගැනීම පිරිහී ඇති බැවින්, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය රජයේ ප්‍රමුඛතම කාර්යයක් බවට පත් වී ඇත.

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා පහසුකම් සැලසීමට, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින්, අන්තර්ජාලය පදනම් වූ (web-based) මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS), එහි පළමු මොඩියුලය (වාහන මොඩියුලය) ක්‍රියාත්මක කරමින්, 2023 සැප්තැම්බර් 01 දින සිට ස්ථාපිත කර ඇත. මෙම පද්ධතිය මගින්, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා අවශ්‍ය තක්සේරු වටිනාකම ඇතුළු අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් අන්තර්ජාලය පදනම් වූ මධ්‍යගත විස්තීරණ තත්‍ය කාලීන තොරතුරු වාර්තා කරනු ලබන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරනු ලබයි. මෙම NFAMS පද්ධතිය නිර්මාණය, මෘදුකාංග සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම රජයට අමතර වැය බරක් නොමැතිව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත්වල දායකත්වයෙන් සිදු කරනු ලබයි. අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සඳහා වන NFAMS මොඩියුල ක්‍රියාත්මක කිරීම ඉදිරියේදී ක්‍රමානුකූලව සිදු කරනු ලැබේ. තවද, කොම්ප්ට්‍රෝලර් ජනරාල් ආදායම් ගණන් දීමේ නිලධාරී ලෙස, රජයේ අයතනවල ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් ලැබිය යුතු ආදායම එකතු කිරීමට කටයුතු කරනු ලබයි.

රජයේ මූල්‍ය නොවන වත්කම් නිසිලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය වත්කම් කළමනාකරණ නීතිය පැනවීමට කටයුතු කරමින් පවතී.

1.2. දැක්ම හා මෙහෙවර

(අ) දැක්ම

රාජ්‍ය අංශයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා ලොව පිළිගත් ඉහළම මට්ටමේ ආයතනයක් වීම.

(ආ) මෙහෙවර

රජයේ සංවර්ධන රාමුව ශක්තිමත් කරමින් සහ මෙම වත්කම් අපහරණය කිරීමෙන් ලැබිය යුතු ආදායම එකතු කර ගැනීම සුරක්ෂිත කරමින් කටයුතු කරන අතර රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින්, යාවත්කාලීන කරන ලද විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක වාර්තා කර ඇති රාජ්‍ය අංශයේ මූල්‍ය නොවන වත්කම් ඵලදායී හා කාර්යක්ෂම ලෙස භාවිතා කිරීම සහ කළමනාකරණය කිරීම දිරිගැන්වීම.

1.3 පරමාර්ථ, ප්‍රධාන ක්‍රියාවන් හා ප්‍රධාන කාර්යයන්

(අ) පරමාර්ථ:

(i) රජයේ (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

අ. සියලුම මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ආ. මූල්‍ය නොවන වත්කම් ඵලදායී හා කාර්යක්ෂම උපයෝජනය තුළින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම.

ඇ. මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම නිවැරදිව වාර්තා කිරීම තහවුරු කිරීම.

ඈ. මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ නායකත්ව සහ භාරකාර භූමිකාව ඉටුකිරීම.

(ii) රජයේ ආයතන සතු ප්‍රාග්ධන වත්කම් විකිණීම්වලින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.

(ආ) ප්‍රධාන ක්‍රියාවන්:

(i) රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

අ. සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු වාර්තා කිරීම හා ලේඛනගත කර පවත්වාගැනීම සඳහා (වත්කම්වල වටිනාකම සහිතව වාර්තා කිරීමට හැකිවන පරිදි) යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) පවත්වාගැනීම සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

ආ. මූල්‍ය නොවන වත්කම් උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීම හා වියදම් කළමනාකරණය සඳහා රජයේ දේපල අනිසි කළමනාකරණය, නාස්තිය හා විනාශ වීමට ඉඩහැරීම වැලැක්වීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම:

(ii) රජයේ ආයතන සතු ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම සඳහා ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කිරීම.

(ඇ) ප්‍රධාන කාර්යයන්:

අ. රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳව විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් (මාර්ගගත දත්ත පද්ධතියක් සහිතව) ඇතිකිරීම හා යාවත්කාලීන කර පවත්වාගැනීම සහ වත්කම් කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

ආ. ප්‍රතිපත්ති සහ රෙගුලාසි සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම හා චක්‍රලේඛ නිකුත් කිරීම.

ඇ. රජයේ වත්කම් අත්පත් කරගැනීම, පවත්වාගැනීම සහ අපහරණය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම.

ඈ. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දැනුවත් භාවය වැඩිදියුණු කිරීම සහ මෙම වත්කම් උපරිම ඵලදායීතාවයෙන් භාවිතා කිරීම සඳහා අවශ්‍ය හොඳම භාවිතයන් හඳුන්වාදීම.

ඉ. රජයේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු ලබාදීම.

ඊ. රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන වාහනවල නෛතික අයිතිය පිළිබඳව පවතින ගැටළු නිරාකරණය කිරීම.


උ. රාජ්‍ය ආයතනවල අවශ්‍යතාවයන් සපුරාලීමට මූල්‍ය නොවන වත්කම් වෙන්කර දීම.

ඌ. රජයේ ආයතන සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනවල වාහන මිලදීගැනීම සඳහා නිර්දේශ ලබාදීම.

එ. රජයේ ආයෝජන හා රාජ්‍ය මූල්‍ය ශේෂයන් සඳහා සහායවීමට, නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම් හඳුනා ගැනීම සහ අදාල තොරතුරු සැපයීම / රෙගුලාසි නිකුත් කිරීම.

ඒ. රජයේ ආයතන සතු ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම එකතු කිරීම හා වාර්තා කිරීම.

1.4 සංවිධාන සටහන



සං.නි. - සංවර්ධන නිලධාරී

ක.සේ.නි. - කළමනාකරණ සේවා නිලධාරී

කා.කා.ස. - කාර්යාල කාර්ය සහායක

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම තහවුරු කිරීම සඳහා, මෙම වත්කම් පිළිබඳව යාවත්කාලීන කල විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම සහ නිසි පරිදි ප්‍රයෝජනයට නොගන්නා සම්පත් හඳුනාගනිමින් හා මෙම වත්කම් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරමින් රජයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

2.1. රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා යාවත්කාලීන කළ විස්තීර්ණ මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වා ගැනීම

පළමු අදියර ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2014 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන අත්පොතෙහි වත්කම් කේත වර්ගීකරණය පදනම් කර ගනිමින්, රජයේ මූල්‍ය නොවන වත්කම්, එනම් වාහන, ගොඩනැගිලි, ඉඩම්, ඉදිකිරීම්, පිරියත හා යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳව මූලික තොරතුරු රැස් කිරීම සඳහා උපදෙස් ලබාදීම පිණිස 2017 ජූනි 28 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක. 01/2017 නිකුත් කරන ලදී.

(අ) විස්තීර්ණ මධ්‍යගත අන්තර්ජාලය පදනම් වූ (web-based) දත්ත පද්ධතියක් හා කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම

රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම සඳහා විස්තීර්ණ මධ්‍යගත අන්තර්ජාලය පදනම් වූ (web-based) දත්ත පද්ධතියක් හා කළමනාකරණ ක්‍රමවේදයක් ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් තොරතුරු පද්ධතිය (ITMIS) මඟින් ස්ථාපිත කිරීමට දැඩි ප්‍රයත්නයක් දැරුවද එය අසාර්ථක වූ බැවින්, කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය විසින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව අන්තර්ජාලය පදනම් වූ මධ්‍යගත විස්තීරණ තත්‍ය කාලීන තොරතුරු වාර්තා කරනු ලබන කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. ඒ අනුව, අන්තර්ජාලය පදනම් වූ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින් 2023 සැප්තැම්බර් 01 දින සිට ස්ථාපිත කර ඇත. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය වඩාත් ක්‍රමවත් කිරීම සහ මෙම වත්කම් පිළිබඳ තොරතුරු පවත්වා ගැනීමේ සහ වාර්තා කිරීමේ වගවීම ඉහළ නැංවීම මෙම තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් අපේක්ෂා කෙරේ. තවද, මෙම NFAMS පද්ධතිය මඟින් සෑම රාජ්‍ය ආයතනයකටම ඔවුන්ගේ වත්කම් ලේඛනය අන්තර්ජාලය පදනම් වූ පද්ධතියක (web - based platform) පවත්වාගෙන යාමට සහ මෙම වත්කම් කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සපයනු ඇත. මෙම NFAMS පද්ධතියෙහි පළමු පියවර ලෙස වාහන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර ඇත. ඉදිකිරීම් මොඩියුලයේ මෘදුකාංග සංවර්ධනය සිදු කෙරෙමින් පවතින අතර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සඳහා වන NFAMS මොඩියුල හඳුන්වාදීම ඉදිරියේදී ක්‍රමානුකූලව සිදු කරනු ලැබේ.

(ආ) මධ්‍යගත දත්ත පද්ධතිය - වාහන


වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 නිකුත් කරමින් 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කරන ලද අන්තර්ජාලය පදනම් වූ තත්‍ය කාලීන තොරතුරු වාර්තා කරන මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) යටතේ 2025 මැයි 30 දිනට වාර්තා කර ඇති පරිදි, රාජ්‍ය ආයතන සතු/භාවිතා කරන මුලු වාහන ප්‍රමාණය 93,378 (ධාවනය කල හැකි තත්වයේ පවතින වාහන 89,420 සහ ධාවනය කල නොහැකි තත්වයේ පවතින වාහන 3,958) ක් වේ. මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි නොකල ඉදිකිරීම් කර්මාන්තයට භාවිතා කරන වාහන, බෝට්ටු සහ ඉඩම් වාහන වැනි වාහන ද මෙම වාහන ප්‍රමාණයට ඇතුලත් වේ. මෙම වාහන ප්‍රමාණයෙහි විශ්ලේෂණය වාහනවල වයස සහ වර්ගය අනුව පහත සඳහන් පරිදි වේ.


වගුව 2.1 : රජයට අයත් සමස්ත වාහන සංඛ්‍යාවෙහි වයස් විශ්ලේෂණය - 2025.05.30 දිනට

වාහන වර්ගය*	වසර 0 - 5	වසර 6 - 10	වසර 11-15	වසර 15ට වඩා පැරණි	එකතුව
යතුරු පැදි	752	4,135	4,382	6,638	15,907
කාර්	717	1,962	4,852	5,282	12,813
ද්විත්ව කාර්යය වාහන	246	1,668	2,662	5,679	10,255
බස්	565	1,095	2,848	2,988	7,496
මෝටර් ලොරි	284	1,449	1,335	3,713	6,781
ඉඩම් වාහන	199	987	1,571	3,192	5,949
ඩබල් කැබ්	168	1,001	1,519	2,256	4,944
ත්‍රිරෝද රථ	2,031	422	745	1,168	4,366
ට්‍රැක්ටර්	358	512	1,178	1,787	3,835
මෝටර් කෝච්	43	397	738	1,288	2,466
ට්‍රැක්ටර් ටෙලර් / බවුසර්	901	687	1,086	1,802	4,476
ගිලන් රථ	154	680	444	884	2,162
වෑන්	90	563	572	867	2,092
සිංගල් කැබ්	80	453	404	504	1,441
විශේෂ කාර්ය වාහන	177	692	297	251	1,417
ට්‍රක්	272	126	401	527	1,326
අනෙකුත් වාහන	644	1,168	1,132	2,708	5,652
එකතුව	**7,681**	**17,997**	**26,166**	**41,534**	**93,378**

*වාහනයේ වර්ගය (අනෙකුත් වාහන හැර), මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාහන ලියාපදිංචි සහතිකයේ දක්වා ඇති වර්ගීකරණය මත පදනම් වන අතර මෙහි සඳහන් කාර්, ද්විත්ව කාර්යය වාහන අනෙකුත් වාහන වර්ග වලට වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 හි සඳහන් සුඛෝපභෝගී කාණ්ඩයේ වාහන ද ඇතුලත් වේ.

මූලාශ්‍රය : කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය





(ඇ) මධ්‍යගත දත්ත පද්ධතිය - ගොඩනැගිලි

රජයේ ගොඩනැගිලි පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු රැස්කිරීමට 2022 ජනවාරි මස 03 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2022 නිකුත් කරන ලදී. ඒ අනුව, රාජ්‍ය ආයතන විසින් වාර්තා කර ඇති පරිදි 2021 දෙසැම්බර් 31 දිනට, කුළියට ලබා දී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය වගුව 2.2 හි සඳහන් පරිදි වේ. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලිවල භාවිතා කරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 57.1ක් හා කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලිවල භාවිතා කරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 2.9ක් වන අතර ඒ සඳහා වැය වූ වාර්ෂික වියදම රු. බිලියන 11.6ක් වේ. මේ අතර, භාවිතා නොකරනු ලබන බිම් ප්‍රමාණය වර්ග මීටර් මිලියන 0.8ක් පමණ වේ. තවද, රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලිවල බිම් ප්‍රමාණයෙන් වර්ග මීටර් මිලියන 1.7ක් කුළියට ලබාදී ඇති අතර එමඟින් රාජ්‍ය ආයතනවලින් රු. බිලියන 6.2ක හා පෞද්ගලික ආයතනවලින් රු. බිලියන 3.1ක වාර්ෂික ආදායමක් උපයා ඇත.

වගුව 2.2: කුළියට ලබාදී ඇති ස්ථාන ඇතුලුව රාජ්‍ය ආයතන සතු ගොඩනැගිලි සහ රාජ්‍ය ආයතන විසින් කුළියට/බද්දට ලබාගෙන ඇති ගොඩනැගිලි පිළිබඳ තොරතුරුවල සාරාංශය - 2021.12.31 දිනට

රාජ්‍ය ආයතනය	භාවිත කරනු ලබන බිම් ප්‍රමාණය (වර්ග මීටර්)			භාවිත නොකරනු ලබන බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	.වාර්ෂික කුළී/බදු වියදම (රු. මිලි.)	බදු දී ඇති ස්ථාන	
	අයිතිය සතු	කුළියට/ බද්දට	එකතුව			බිම් ප්‍රමාණය (වර්ග මීටර්)	වාර්ෂික ආදායම (රු. මිලි.)
රජයේ ආයතන සහ රාජ්‍ය ව්‍යාපාර	46,041,744	2,680,256	48,722,000	596,855	11,439.6	970,225	8,564.2
පළාත් සභා සහ පළාත් පාලන ආයතන	11,137,528	200,502	11,338,030	188,345	148.4	721,656	749.6
එකතුව	**57,179,272**	**2,880,758**	**60,060,030**	**785,200**	**11,588.0**	**1,691,881**	**9,313.8**

සටහන: ගරාජ, නිල නිවාස, සංචාරක බංගලා, නිවාඩු නිකේතන සහ අනෙකුත් එවැනි නේවාසික නොවන ගොඩනැගිලිවල තොරතුරු මෙම තොරතුරු වලට ඇතුලත් නොවේ.

NFAMS පද්ධතිය යටතේ වන ගොඩනැගිලි මොඩියුලය ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ අනුව, යාවත් කාලීන කල ගොඩනැගිලි දත්ත පද්ධතිය සකස් කරනු ලැබේ.

(ඈ) මධ්‍යගත දත්ත පද්ධතිය - ඉඩම්

රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු රැස්කිරීමට 2022 ජනවාරි මස 07 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2022 නිකුත් කරන ලදී. ඒ අනුව, ඇතැම් රාජ්‍ය ආයතන විසින් තොරතුරු ඉදිරිපත් කරන ලද අතර, රාජ්‍ය ආයතන 740ක් විසින් එම තොරතුරු නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණි. තවද, රාජ්‍ය ආයතන 395ක් විසින් ඉඩම් පිළිබඳ තොරතුරු අනාවරණය කර නොතිබුණි.

වගුව **2.3: රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ සාරාංශය-2021.12.31** දිනට

රාජ්‍ය ආයතනය / ඉඩම් භාවිතය		**ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර)**
රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය		**1,490,951**
	එයින් වනාන්තර	1,125,700
i	**භාවිත කරනු ලබන**	**1,474,712**
	රජයේ ආයතන	1,404,656
	රාජ්‍ය ව්‍යාපාර	49,563
	පළාත් සභා හා පළාත් පාලන ආයතන	20,493
ii	**භාවිත නොකරනු ලබන**	**13,701**
	රජයේ ආයතන	8,826
	රාජ්‍ය ව්‍යාපාර	4,468
	පළාත් සභා හා පළාත් පාලන ආයතන	407
iii	**භාවිතය පිළිබඳව සඳහන් කර නොමැති**	**2,538**
	රජයේ ආයතන	1,147
	රාජ්‍ය ව්‍යාපාර	1,097
	පළාත් සභා හා පළාත් පාලන ආයතන	294

2021 දෙසැම්බර් 31 දිනට පැවති රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබා දී ඇති ඉඩම් පිළිබඳ තොරතුරුවල සාරාංශය වගුව 2.3හි සඳහන් පරිදි වේ. ඒ අනුව, රාජ්‍ය ආයතන සතු හෝ කුළියට/බද්දට ලබාදී ඇති මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර මිලියන 1.49ක් වන අතර එයින් හෙක්ටයාර මිලියන 1.12ක් වනාන්තරවලින් වැසුනු ඉඩම් වේ. වාර්තා කර ඇති ඉඩම් ප්‍රමාණය තුල භාවිතා කරනු ලබන ඉඩම් හෙක්ටයාර මිලියන 1.47ක් හා භාවිතා නොකරනු ලබන ඉඩම් හෙක්ටයාර 13,702ක් ඇතුලත් වේ. ඉඩම් හෙක්ටයාර 2,537ක ප්‍රමාණය භාවිතා කිරීම පිළිබඳව රාජ්‍ය ආයතන විසින් වාර්තා කර නොමැත.

NFAMS පද්ධතිය යටතේ වන ඉඩම් මොඩියුලය ඉදිරියේදී ක්‍රියාත්මක කරන අතර ඒ අනුව යාවත්කාලීන ඉඩම් දත්ත පද්ධතිය සකස් කරනු ලැබේ.

2.2. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම

(අ) රජයේ වාහන ප්‍රසම්පාදනය කළමනාකරණය කිරීම

2019 වසර මැද සිට, රජයේ ආයතන සඳහා උපයෝගීතා වාහන හැර අනෙකුත් මෝටර් වාහන ප්‍රසම්පාදනය තාවකාලිකව අත්හිටුවමින් 2019 සැප්තැම්බර් 24 වන දින ජාතික අයවැය චක්‍රලේඛ අංක 05/2019 නිකුත් කර ඇත. ඒ අනුව, සංවර්ධන කටයුතු සහ අනෙකුත් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා අවශ්‍ය උපයෝගීතා වාහන සහ ශ්‍රී ලංකා පොලීසියේ භාවිතය සඳහා ආනයනය කරන ලද වාහනද හැර, රජයට අමතර වැය බරක් නොවෙමින් රජයේ වාහන අවශ්‍යතාවය සපුරාලීමට පැවති වාහන ප්‍රමාණය භාවිතා කරමින් කළමනාකරණය කරන ලදී. රජයේ පවතින උපයෝගීතා වාහන වල ඵලදායී භාවිතය හා අවශ්‍යතාවය හඳුනාගනිමින්, උපයෝගීතා වාහන ප්‍රසම්පාදනය සඳහා 2024 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 54 ක් අතරින් උපයෝගීතා වාහන 46 ක් මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීමට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබා දී ඇත.

(ආ) රජය සතු මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කරගැනීම

ඇතැම් රාජ්‍ය ආයතන භාවිතා කරන වාහන සැලකිය යුතු ප්‍රමාණයක නීත්‍යානුකූල අයිතිය එම ආයතන සතු නොවන අතර නීත්‍යානුකූල අයිතිය වෙනත් ආයතනයක් සතු වන බව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් හඳුනාගන්නා ලදී. එබැවින්, මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිය නිරාකරණය කර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදෙමින් 2017 දෙසැම්බර් 21 වන දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 හා 2018 ඔක්තෝම්බර් 10 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2018 නිකුත් කරන ලදී. මෙලෙස, 2024 වර්ෂයේ දී වාහන 319 ක ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිරාකරණය කර ඇත. ඒ අනුව, කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වාහන 982 ක ලියාපදිංචි හිමිකාරිත්වය පිළිබඳ ගැටළු නිරාකරණය කර ඇත.

(ඇ) රාජ්‍ය ආයතනවල පවතින විශාල වැය බරක් වන සුඛෝපභෝගී වාහන රජයේ ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීම

2024 දෙසැම්බර් 02 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයට අනුව, රාජ්‍ය ආයතනවල පවතින භාවිතය ආර්ථිකයමය වශයෙන් ඵලදායී නොවන හා එම ආයතනවල භාවිතයට අවශ්‍ය නොවන එන්ජින් ධාරිතාව 1800 CC ට වැඩි පෙට්‍රල් වාහන / එන්ජින් ධාරිතාව 2300 CC ට වැඩි ඩීසල් වාහන (ඩබල් කැබ්. සින්ගල් කැබ්, වෑන්, බස්, ලොරි හා ට්‍රක් යනාදිය හැර) අදාල ආයතනයේ වාහන අවශ්‍යතාව තක්සේරු කිරීමෙන් අනතුරුව අපහරණය කිරීම සඳහා සියළුම රාජ්‍ය ආයතනවලට උපදෙස් ලබා දෙමින් 2024 දෙසැම්බර් 18 දිනැතිව වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 නිකුත් කරන ලදී.

(ඈ) ධාවන තත්ත්වයේ නොමැති වාහන අපහරණය කිරීම හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීම

රජයේ වාහන විනාශවීම සහ රජයේ ආදායම අහිමි වීම වැළැක්වීම සඳහා මෙම වාහන නිසි ලෙස භාවිතා කිරීම හා නියමිත වේලාවට අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම සහතික කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා, සියලුම රාජ්‍ය ආයතන වලට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් 2020 ඔක්තෝබර් 02 වැනි දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 නිකුත් කර ඇත. වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2022 සහ අංක 05/2024 මගින් ද, නිසි නඩත්තුව සහ නොසැලකිලිමත් භාවිතය වැලක්වීමෙන් වාහන නිසි ලෙස භාවිත කිරීමේ සහ අදාල උපදෙස් පිළිපැදීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත.

(ඉ) මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශය

1992 වර්ෂයේදී නිකුත් කල රජයේ මුදල් රෙගුලාසි හෝ මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කල චක්‍රලේඛ මගින් රජයේ වාහන, ගොඩනැගිලි, ඉඩම්, ඉදිකිරීම් පිරියත හා යන්ත්‍රෝපකරණ සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩවල වටිනාකම තක්සේරු කිරීම සඳහා උපදෙස් ලබා දී නොතිබුණි. එබැවින්, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, 02/2019 සහ 05/2021 මගින් මෙම වත්කම් තක්සේරු කිරීම සඳහා වන ප්‍රතිපත්තිය සකස් කරන ලදී. එම චක්‍රලේඛ මගින් වාහනවල වටිනාකම තක්සේරු කිරීම සඳහා ලබා දුන් උපදෙස් ද ඇතුලත් කරමින්, වාහනවල වටිනාකම තක්සේරු කිරීම සඳහා වන උපදෙස් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2024 මගින් ලබා දී ඇත. සියළුම මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) තුල වාර්තා කරනු ලැබේ.

2.3. ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම

2018 මාර්තු 22 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(xii) අනුව, 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම් ගිණුම් තැබීම සඳහා ගණන්දීමේ නිලධාරී ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් පත් කර ඇත. මේ සඳහා, 2025 වර්ෂයට අදාළ ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම හා 2024 වර්ෂයට අදාල සංශෝධිත ඇස්තමේන්තු ලබාගැනීමට අදාල ආයතන වලට උපදෙස් ලබාදීම සඳහා 2024 මැයි 28 දින වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 03/2024 නිකුත් කරන ලදි. තවද, 2024 වර්ෂයේ ජූනි 30 දිනට හිඟ ආදායම්, මුල් මාස හය තුළ රැස්කළ හිඟ ආදායම් හා අදාල කාල පරිච්ඡේදය තුළදී අත්හරිනු ලැබූ ආදායම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා 2024 ජූනි 05 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2024 හා 2024 වර්ෂය තුළ රැස්කළ හිඟ ආදායම් හා අදාල කාල පරිච්ඡේදය තුළදී අත්හරිනු ලැබූ ආදායම් පිළිබඳ තොරතුරු ලබාගැනීමට 2024 දෙසැම්බර් 19 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2024 නිකුත් කරන ලදී.

වගුව 2.4: ප්‍රාග්ධන වත්කම් විකිණීම් ආදායම (රු. මිලියන)

විස්තරය	2020	2021	2022	2023	2024
ප්‍රාග්ධන වත්කම් විකිණීම් - වාහන	201.0	128.3	226.4	329.6	136.0
ප්‍රාග්ධන වත්කම් විකිණීම් - වෙනත්	56.0	60.1	357.8	186.3	974.1
එකතුව	**257.0**	**188.4**	**584.2**	**515.9**	**1110.1**

2023 වර්ෂයේදී රුපියල් මිලියන 329.6 ක් වූ වාහන විකිණීමෙන් ඉපයූ ආදායම 2024 වර්ෂයේදී රුපියල් මිලියන 136.0 දක්වා අඩු වී ඇත. කෙසේ වෙතත්, අනෙකුත් වත්කම් විකිණීමෙන් 2023 වර්ෂයේදී ඉපයූ රුපියල් මිලියන 186.3 ක ආදායමට සාපේක්ෂව 2024 වර්ෂයේදී එම ආදායම රුපියල් මිලියන 974.1 දක්වා වැඩි වී ඇත. ඒ අනුව, ප්‍රාග්ධන වත්කම් විකිණීමෙන් 2023 වර්ෂයේදී ඉපයූ රුපියල් මිලියන 515.9 ක මුළු ආදායමට සාපේක්ෂව 2024 වර්ෂයේ දී එම ආදායම රුපියල් මිලියන 1110.1 ක් දක්වා වැඩි වී ඇත. ඒ අනුව, 2024 වර්ෂයේදී මෙම මුළු ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය මූලික මුළු ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව 370% ක් වේ.

2.4 අභියෝග සහ අනාගත අරමුණු

I. රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා මධ්‍යගත මාර්ගගත (online) කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා පැවති බාධාවන් හා අභියෝග ජයගනිමින්, මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) 2023 සැප්තැම්බර් 01 දින සිට ස්ථාපිත කර ඇත. මෙම NFAMS පද්ධතිය නිර්මාණය, මෘදුකාංග සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම, වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ සහ තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මානව සම්පත්වල දායකත්වයෙන් සිදු කරනු ලැබේ. මෙහි පළමු අදියර ලෙස වාහන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර ඇත. අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සඳහා වන NFAMS මොඩියුල ක්‍රියාත්මක කිරීම ඉදිරියේදී ක්‍රමාණුකූලව සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, NFAMS පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා මෙම පද්ධතියෙහි තොරතුරු නිවැරදිව තත්‍ය කාලීනව වාර්තා කිරීම සඳහා වන සියළු රාජ්‍ය ආයතනවල අනුගත වීම වැඩිදියුණු කර ගැනීම තවදුරටත් අභියෝගාත්මක වේ.

II. NFAMS කළමනාකරණ තොරතුරු පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කරමින් රාජ්‍ය ආයතනවල (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර සහ පළාත් සභා හා පළාත් පාලන ආයතන) මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා පහසුකම් සැපයීමට සහ යාවත්කාලීන කළ තොරතුරු මත පදනම්ව මෙම වත්කම් අපහරණය, ආදායම් ඉපයීම, වියදම් කළමනාකරණය සහ භාවිතයට නොගන්නා හා ඌන උපයෝජන වත්කම් ඵලදායීව යොදාගැනීම ඇතුලත්ව මෙම වත්කම් කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ නිකුත් කරමින් රාජ්‍ය ආයෝජනයට පහසුකම් සපයමින් රජයේ සංවර්ධන රාමුව ශක්තිමත් කිරීම සඳහා රජයේ ප්‍රතිපත්ති සකස් කිරීමට සහාය වීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා සියළු රාජ්‍ය ආයතනවල සහයෝගය අවශ්‍ය වන අතර එය අභියෝගාත්මක වේ.

III. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය ස්ථාපිත කිරීමේ සිට අවශ්‍ය කාර්යමණ්ඩල පුරප්පාඩු පුරවා ගැනීම සඳහා වන බාධාවන් හේතුවෙන් අවශ්‍ය කාර්යමණ්ඩලය නොමැති වීම හේතුවෙන් මෙම ආයතනයේ කටයුතු පවත්වා ගැනීම අභියෝගාත්මක වී ඇත.

කොම්ප්ට්‍රෝලර් ජනරාල්

පරිච්ඡේදය 03 - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒඑසිඒ-එන්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තක්සා 2024 රු.	2023 රු.	
-	ආදායම් ලැබීම්		1,110,150,162	515,895,718	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	ඒඑසිඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	1,110,150,162	515,895,718	
-	මුළු ආදායම් ලැබීම් (අ)		**1,110,150,162**	**515,895,718**	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		45,789,000	43,466,000	ඒඑසිඒ-3
-	තැන්පතු		133,392	48,827	ඒඑසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		4,178,005	2,268,828	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**50,100,397**	**45,783,655**	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**1,160,250,559**	**561,679,373**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		579,105	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**1,159,671,454**	**561,679,373**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
32,200,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	29,279,516	28,322,522	
17,580,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	14,832,517	15,339,189	
250,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	215,139	246,042	ඒඑසිඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
50,030,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		**44,327,172**	**43,907,753**	
	මූලධන වියදම්				
815,200	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	814,982	433,551	
2,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,909,767	1,126,251	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඑසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	497,000	187,940	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
3,315,200	මුළු මූලධන වියදම් (උ)		**3,221,749**	**1,747,742**	
	තැන්පතු ගෙවීම්		133,392	48,827	ඒඑසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		3,949,656	2,140,586	ඒඑසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**4,083,048**	**2,189,413**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**51,631,969**	**47,844,908**	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**1,108,039,485**	**513,834,465**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		1,108,039,485	513,834,465	ඒඑසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		**1,108,039,485**	**513,834,465**	ඒඑසිඒ-3

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කළඹ	
		2024	2023
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	15,162,292	13,515,736
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	4,893,547	5,121,896
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**20,055,839**	**18,637,632**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		4,893,547	5,121,896
දේපළ පිරියත හා උපකරණ සංචිතය		15,162,292	13,515,736
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**20,055,839**	**18,637,632**

පිටු අංක 07 සිට 26 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 32 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	සභාපති මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම : කේ. ඒ. රම්‍යා කාන්ති	කොමිප්ට්‍රොලර් ජනරාල් අධීක්ෂණය (මූදල්)/ කොමසාරිස් (මූදල්)
තනතුර : මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්	තනතුර : කොමිප්ට්‍රොලර් ජනරාල් මහා භාණ්ඩාගාරය කොළඹ 01	නම : ඩී. එම්. ධර්මසේකර
දිනය : 2025.02.20	දිනය : 2025-02-20	දිනය : 2025-02-20

මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තක්සා	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	1,840,829	1,503,071
අග්‍රිම ලැබීම්	45,789,000	43,466,000
අත්තිකාරම් අයකර ගැනීම්	4,455,614	2,531,710
තැන්පතු ලැබීම්	133,392	48,827
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**52,218,835**	**47,549,608**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	43,957,858	43,366,411
සහනාධාර සහ මාරුකිරීම්	215,139	246,042
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	161,936	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	579,105	-
අත්තිකාරම් ගෙවීම්	3,949,656	2,140,586
තැන්පතු ගෙවීම්	133,392	48,827
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**48,997,086**	**45,801,866**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**3,221,749**	**1,747,742**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භූමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	3,221,749	1,747,742
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**3,221,749**	**1,747,742**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(3,221,749)**	**(1,747,742)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

මූල්‍ය ප්‍රකාශන සටහන් නොමැත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුව ට % ලෙස
20.06.02.01	ප්‍රාග්ධන වත්කම් විකිණීම - වාහන	200,000,000	136,000,000	136,021,462	100%
20.06.02.02	ප්‍රාග්ධන වත්කම් විකිණීම - වෙනත්	100,000,000	974,000,000	974,128,700	100%

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	49,980,000	50,030,000	44,327,172	89
ප්‍රාග්ධන	3,100,000	3,315,200	3,221,749	97

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන -** අදාල නොවේ.

රු. 000'.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

000' රු.

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	---	---	---	---
9152	යන්ත්‍රෝපකරණ	15,162,292	15,162,292	---	100
9153	ඉඩම්	---	---	---	---
9154	අස්පෘශ්‍ය වත්කම්	---	---	---	---
9155	ජීව විද්‍යාත්මක වත්කම්	---	---	---	---
9160	කෙරීගෙන යන වැඩ	---	---	---	---
9180	බදු දෙන ලද වත්කම්	---	---	---	---

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති වාර්තාව මේ සමඟ අමුණා ඇත.

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා මධ්‍යගත මාර්ගගත දත්ත පද්ධතිය සකස් කිරීම		√	
රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා වන මධ්‍යම වත්කම් ලේඛණයෙහි තොරතුරු වාර්තා කිරීම හා ලේඛණගත කර පවත්වාගැනීම.		√	
රාජ්‍ය ආයතන විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳව ගැටළු නිරාකරණය කිරීම	√		
රජයේ මෝටර් වාහන ප්‍රමාණය කළමනාකරණය කිරීම	√		
රජයේ ආයතනවල මූල්‍ය නොවන වත්කම් අපහරණය කිරීම තුළින් ලැබෙන ආදායම් රැස් කිරීම	√		
රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම		√	
පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය	√		

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

පරමාර්ථය	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ දර්ශක ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50-74%	75-100%
පරමාර්ථ 6 - සැමට ජලය ලැබීම හා තිරසර ජල කළමනාකරණය හා සනීපාරක්ෂාව ලැබීම තහවුරු කිරීම.	**6.6** 2030 වන විට ජලය සමග බැඳී පවතින පරිසර පද්ධති වන කඳු, වනාන්තර, තෙත්බිම්, ගංගා, වගුරු බිම් හා වැව් ආරක්ෂා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම.	**6.6.1** කාලය සමඟ ජලය ආශ්‍රිත පරිසර පද්ධතිවල ප්‍රමාණය වෙනස් වීම	5.2 ඡේදය හා සම්බන්ධ වේ.		
පරමාර්ථ 7 - දරාගත හැකි වූ, විශ්වාසය වූ, තිරසර හා නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම.	**7.2** 2030 වන විට ලෝක බලශක්ති මූලාශ්‍රයන්හි පුනර්ජනනීය බලශක්තීන්හි කොටස ඉහළ නැංවීම.	**7.2.1** සමස්ථ ඉන්ධන පරිභෝජනයේ ප්‍රතිශතයක් ලෙස පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණය.	5.2 ඡේදය හා සම්බන්ධ වේ.		
පරමාර්ථ 8 - අන්තර්ග්‍රහණීය සහ තිරසර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියාවක් හා සැමට ගෞරවනීය වෘත්තියක් ලැබීම ප්‍රවර්ධනය කිරීම.	**8.1** ජාතික තත්වයන්ට අනුකූලව ඒක පුද්ගල ආර්ථික වර්ධනය පවත්වාගෙන යාම සහ විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් වසරකට අවම වශයෙන් 7% ක දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනයක් පවත්වාගෙන යාම	**8.1.1** ඒක පුද්ගල තථ්‍ය ද.දේ.නි. වාර්ෂික වර්ධනය	5.2 ඡේදය හා සම්බන්ධ වේ.		
පරමාර්ථ 11 - නගර හා මානව ජනාවාස අන්තර්ග්‍රහණය, ආරක්ෂිත ප්‍රත්‍යාස්ථ හා තිරසාර බවට පත්කිරීම.	**11.3** 2030 වන විට, සියලුදෙනා අන්තර්ග්‍රහණය වූ සහ තිරසර නාගරීකරණය දියුණු කිරීම සහ සියලුම.රටවල සහභාගීත්ව, ඒකාබද්ධ හා තිරසාර මානව ජනාවාස සැලසුම් කිරීම, සහ ධාරිතාවන් වැඩි දියුණු කිරීම	**11.3.1** භූමි පරිභෝජන වේගය සහ ජනගහන වර්ධන වේගය අතර අනුපාතය.	5.2 ඡේදය හා සම්බන්ධ වේ.		
පරමාර්ථ 12 - තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටා තහවුරු කිරීම	**12.7** ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවයන්ට අනුව තිරසාර වන රාජ්‍ය ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම.	**12.7.1** තිරසර වන රාජ්‍ය ප්‍රසම්පාදන ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන රටවල් ගණන.	5.2 ඡේදය හා සම්බන්ධ වේ.		
පරමාර්ථ 15- භෞමික පරිසර පද්ධති ආරක්ෂා කරගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම හා තිරසර භාවිතය ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම, කාන්තාරකරණය	**15.1** 2030 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂයෙන් වනාන්තර, තෙත් බිම්, කඳු සහ වියළි බිම් අන්තර්ජාතික ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම.	**15.1.1** සමස්ථ ඉඩම් ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස වනාන්තර බිම් ප්‍රමාණය.	5.2 ඡේදය හා සම්බන්ධ වේ.		

වැලැක්වීම, භූමි භායනය වලක්වා එය ප්‍රතිවර්ථනය කිරීම හා ජෛව විවිධත්වය අහිමිවීම නැවැත්වීම.	**15.2** 2030 වන විට සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්වයට පත්කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම.	**15.2.1** වනාන්තර තිරසර කළමනාකරණය සඳහා වන ප්‍රගතිය.	
පරමාර්ථ 17 - තිරසර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගිතාවය ක්‍රියාත්මක කිරීමේ සහ නව ජීවයක් දීමේ මාර්ග ශක්තිමත් කිරීම.	**17.1** බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය ශක්තිමත් කිරීම.	**17.1.1** ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස රජයේ සමස්ථ ආදායම, මූලාශ්‍රයන් අනුව.	මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය ඇස්තමේන්තු කළ ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස තථ්‍ය ආදායම 100% ක් වේ.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආර්ථික හා සමාජ සංවර්ධනය ඉලක්ක කර ගනිමින් හඳුන්වා දී ඇති එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය ආයතන විසින් සපුරා ගත යුතු වේ. කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ විෂය පථය සෘජුවම තිරසර සංවර්ධන අරමුණු වෙත සම්බන්ධ නොවේ. කෙසේ වුවද, ඵලදායී ලෙස රජයේ මූල්‍ය නොවන වත්කම් භාවිතා කිරීම සහතික කරමින් රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය විධිමත් පරිදි සිදුකිරීම තුලින් තිරසර සංවර්ධන ඉලක්ක මගින් බලාපොරොත්තු වන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට අනුගත විය හැකි වේ. ඒ අනුව, රජයේ මූල්‍ය නොවන වත්කම් සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සහ රජයේ ආයතන සතු මූල්‍ය නොවන වත්කම් විකිණීම් ආදායම් සඳහා ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කිරීම මඟින්, ඉහත 5.1 හි හඳුනාගෙන ඇති පරිදි ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය දායක වේ.

රාජ්‍ය ආයතන විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ උපදෙස් සඳහා නිසි ලෙස අනුගත නොවීම ප්‍රධාන අභියෝගයක් ලෙස හඳුනාගෙන ඇත.

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	12	05	07
තෘතීයික	01	00	01
ද්විතියික	18	17	01
ප්‍රාථමික	10	06	04

6.2 ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි මානව සම්පත් හිඟය / අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.

කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා සේවයේ අවශ්‍යතාවය අනුව තනතුරු පුරප්පාඩු පිරවිය යුතු වේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම		පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු '000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
01	Advanced Excel පිළිබඳ වැඩමුළුව	03	එක් දින			දේශීය	MS Excel පිළිබඳ දැනුම වර්ධනය කිරීම
02	නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	02	දින 02	26		දේශීය	අදාල නිලධාරියාගේ නිවාඩු විෂය පිළිබඳ දැනුම වර්ධනය කිරීම
03	විශ්‍රාම වැටුප් ගණන් බැලීම හා ගෙවීම් පිළිබඳ පුහුණුව	01	දින 02	13	-	දේශීය	විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම වර්ධනය කිරීම
04	ගබඩා කළමනාකරණය සහ මිලදී ගැනීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ වැඩමුළුව	02	දින 02	26	-	දේශීය	ගබඩා කළමනාකරණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම
05	ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම	05	දින 02	43	-	දේශීය	සේවා ගුණාත්මකභාවය හා සේවක අභිප්‍රේරණය ඉහල නැංවීම
06	පරිපාලන නිලධාරීන්ගේ රාජකාරි සහ වගකීම් පිළිබඳ පුහුණුව	01	දින 02	13	-	දේශීය	අදාල නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

වැඩසටහනේ නම		පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු '000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
07	විශ්‍රාම වැටුප් ගෙවීම	03	දින 02	39	-	දේශීය	විශ්‍රාම වැටුප් පිළිබඳ දැනුම වර්ධනය කිරීම
08	දීප ව්‍යාප්ත සේවාවේ විශේෂ ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන විශේෂ වැඩමුළුව	01	දින 03	-	-	දේශීය	අදාල නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
09	රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	දින 10	40	-	දේශීය	රාජ්‍ය ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම වර්ධනය කිරීම
10	MS Excel සහ Power BI භාවිතයෙන් දත්ත විශ්ලේෂණය පිළිබඳ පුහුණුව	05	දින 03	100	-	දේශීය	MS Excel සහ Power BI පිළිබඳ දැනුම වර්ධනය කිරීම
11	"වැටුප් පරිවර්තනය" පිළිබඳ දෙදින වැඩමුළුව	01	දින 02	13	-	දේශීය	"වැටුප් පරිවර්තනය" පිළිබඳ දැනුම වර්ධනය කිරීම
12	තොරතුරු සන්නිවේදන තාක්ෂණය	01	දින 02	13	-	දේශීය	තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම
13	රාජ්‍ය මූල්‍ය රෙගුලාසි	01	දින 03	18	-	දේශීය	රාජ්‍ය මූල්‍ය රෙගුලාසි පිළිබඳ දැනුම වර්ධනය කිරීම
14	ශ්‍රී ලංකාව සඳහා නිදහස් වෙළඳ කලාප (වරාය) ඉදිකිරීම් පිළිබඳ වැඩමුළුව	01	දින 14	-	USD 375	විදේශීය	වෘත්තීමය දැනුම ශක්තිමත් කිරීම
15	ශ්‍රී ලංකාවේ තරුණ රාජ්‍ය තාන්ත්‍රිකයින් සඳහා වන වැඩමුළුව	01	දින 14	-	USD 375	විදේශීය	වෘත්තීමය දැනුම ශක්තිමත් කිරීම
16	සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසාර සංවර්ධන ධාරිතාව සහ තිරසාර සංවර්ධනය සඳහා සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය	01	දින 14	-	USD 375	විදේශීය	වෘත්තීමය දැනුම ශක්තිමත් කිරීම
17	Belt and Road රටවල් සඳහා පාලන ධාරිතාව සම්බන්ධ සම්මන්ත්‍රණය	02	දින 14	-	USD 750	විදේශීය	වෘත්තීමය දැනුම ශක්තිමත් කිරීම

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		

6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අදාල නොවේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	සංචිත වාහන නොමැත		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාල නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාල නොවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධ යෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අදාල නොවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අදාල නොවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		

15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක. 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. TPD/B/CGO/24/14/FA

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2025 මැයි 31 දින

කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය
03 JUN 2025
මූදල් අමාත්‍යාංශය, කොළඹ 01.

ගණන්දීමේ නිලධාරී
කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය

ශීර්ෂය 333 - කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 333 - කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ

සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය

ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා

දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

3.1.1 ප්‍රතිපාදන ඌන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 02 කට අදාලව එකතුව රු.7,200,000 ක් වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.808,557 ක් මු.රෙ.66 මඟින් වෙනත් වැය විෂයයන් සඳහා මාරු කල පසු ද රු.1,633,813ක් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණ අතර එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17ක් හා සියයට 41ක් ව පැවතුණි.

3.1.2 ප්‍රතිපාදන මාරු කිරීම

(අ) වැය විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.150,000 න් රු.149,300 ක ප්‍රතිපාදන මු.රෙ.66 මඟින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එම මාරු කිරීම ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 99 ක් හා සියයට 100 ක් විය.

(ආ) ප්‍රමාණවත් පරිදි වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොගැනීම නිසා වැය විෂයයන් 02ක් සඳහා රු.265,200ක මු.රෙ.66 මඟින් අමතර ප්‍රතිපාදන ලබා ගෙන තිබූ අතර එය මුල් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 25 ක් හා සියයට 36ක් විය. 333-1-1-0-1302 වැය විෂයය සඳහා රු.346,950 ක් මු.රෙ 66 මඟින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණු අතර එය මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 116 ක් වී තිබුණි.

(ඇ) වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන සලසාගෙන නොතිබූ 333-1-1-0-1102 දරන වැය විෂයය සඳහා අතර රු.577,577 ක ප්‍රතිපාදන මු.රෙ 66 මඟින් ලබා ගෙන තිබුණි.

3.2 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

රජයේ සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම තුළින් රජයේ වත්කම් කළමනාකරණය, වත්කම් පිළිබඳ පිරිවැය කළමනාකරණය හා අධීක්ෂණය කිරීම අරමුණු කොටගෙන 2017 වර්ෂයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය යෝජනාවක් අනුව කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය පිහිටුවා තිබුණි. ඒ අනුව ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, නැව්, ගුවන් යානා, යන්ත්‍රෝපකරණ ආදිය ද ඇතුළත් දේශීයව හා විදේශීයව රජය සතු සියලු වත්කම් මධ්‍යගතව

ලේඛනගත කිරීම මෙම කාර්යාලය ඉටු කළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) කාර්යාලය විසින් රාජ්‍ය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ මධ්‍යගත දත්ත පද්ධතියට තොරතුරු ඇතුළත් කළ යුතු රාජ්‍ය ආයතන 1,773 ක් (රජයේ ආයතන හා රාජ්‍ය ව්‍යාපාර, පළාත් සභා සහ පළාත් පාලන ආයතන) 2021 දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබූ අතර, එදිනෙන් පසුව ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු දත්ත පද්ධතිය තුළ යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) වාහන මොඩියුලය යටතේ රජයට අයත් නැව්, ගුවන් යානා, දුම්රිය, මගී ප්‍රවාහන බස්රථ යනාදී වාහන පිළිබඳ තොරතුරු, 2024 දෙසැම්බර් 31 දින වන විටත් දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 අනුව පිරියත, යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සම්බන්ධ තොරතුරු රාජ්‍ය ආයතන වෙතින් ලබාගෙන දත්ත පද්ධතිය තුළ 2024 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි.

(ඈ) රාජ්‍ය ආයතන විසින් වාහන හැර අනෙකුත් වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යලයෙන් ලබාගැනීම සඳහා විධිමත් හා පහසු ක්‍රමවේදයක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ස්ථාපිත කර ක්‍රියාත්මකකර නොතිබුණි.

(ඉ) රාජ්‍ය ආයතනවල සියලුම වත්කම් පිළිබඳව මධ්‍යගතව ලේඛනගතකිරීම හා ඒවා යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විශේෂ අවධානය යොමුකර, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් 2023 අගෝස්තු 09 දින ලබා දුන් නියෝග ප්‍රකාරව, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියට (NFAMS) දත්ත ඇතුළත් කිරීම සම්පූර්ණ කිරීමට කාර්යාලයේද එකඟතාවය මත 2023 දෙසැම්බර් 31 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා පහත සඳහන් කාල රාමුවක් ලබාදී තිබුණි. ඒ අනුව ඉදිකිරීම් මොඩියුලය 2024 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක කර 2024 සැප්තැම්බර් 30 දින සම්පූර්ණ කිරීමටත්, ගොඩනැගිලි මොඩියුලය 2024 ජූලි 01 දින ක්‍රියාත්මක කර 2024 ඔක්තෝබර් 31 දින සම්පූර්ණ කිරීමටත් එකඟ වී තිබුණි. එසේ වුවද, 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම මොඩියුල සම්පූර්ණ කර නොතිබුණි.

(ඊ) කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තක්සේරු වටිනාකම් ඇතුලත් කර මධ්‍යගත ලේඛනය සකසා නොමැති වීම හේතුවෙන් රජයේ ගිණුමේ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දින වනවිට මෙම කාර්යාලය පිහිටුවා වසර 07 ක් ඉක්මගොස් තිබුණ ද, ඉහත දක්වන ලද සියලු වත්කම් ඇතුළත් කොට මධ්‍යගතව ලේඛනගත සකස්කිරීමට හා ඒවා යාවත්කාලීන කිරීමට කාර්යාලය අපොහොසත්වී තිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 41ක් වූ අතර ඉන් තනතුරු 13 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක් ද තෘතික මට්ටමේ 01 ක්ද ද්විතික මට්ටමේ 01 ක්ද ප්‍රාථමික මට්ටමේ 04 ක්ද වශයෙන් අනුමත මුළු තනතුරු සංඛ්‍යාවෙන් 13 ක් හෙවත් සියයට 32 ක් පුරප්පාඩු පැවතුණි. එසේ වුවද, ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ඇතුලු පුරප්පාඩු තනතුර පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවය අනුව අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට ආයතනය මේ දක්වා විධිමත් පියවර ගෙන නොතිබිණ.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට